සුරස ස්වර සපිරි වසත් ශ්‍රී මියැසිය

# සරස වසන්තය



ඔක්තෝබර් මස 14 සහ 20 යන දෙදින ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික සංගීත ලෝලීන්ට සුවිශේෂ දිනයක් වන වගට සැකයක් නෑ. ඒ මන්ද ''සරස වසන්තය'' සංගීත ප්‍රසංගය මෙල්බර්න් හා සිඩ්නි යන නගරවල අති උත්කර්ශවත් ලෙස පැවැත්වීමට දැන් සියලු කටයුතු සූදානම් වෙමින් පවතින නිසා.
විශේෂයෙන්ම සෝමතිලක ජයමහ නම් වූ සුවිශේෂ ගායන ශිල්පියාගේ පළමු ඕස්ට්‍රේලියානු සංචාරය අප රසිකයිනට සුවිශේෂ අත්දැකීමක් ගෙන දෙන බව නොඅනුමානයි. ප්‍රසංගයට පෙර ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික රසිකයින් වෙනුවෙන් ප්‍රසංගයට සහභාගි වන ප්‍රධාන ගායන ශිල්පීන් වන සෝමතිලක ජයමහ, දීපිකා ප්‍රියදර්ශනී හා දයාන් විතාරණ යන ශිල්පීන් සමග රසවත් සංවාදයකට එක් වන්නට අපට හැකිවුණා.

**මේ දිනවල මොනවගේ කලා කටයුතුවලද නිරත වෙන්නෙ.?**

සෝමතිලක - මම මගේ නවතම සංයුක්ත තැටියෙ පටිගත කිරීම් අවසන් කළා. එය හැකි ඉක්මණින් මගේ රසිකයින්ට තිළිණ කරන්න හිතාගෙන ඉන්නවා. ඒ වගේම මම කලින් කරපු ''සිරි යහනේ'' සංයුක්ත තැටියෙ සියලු ගීත නැවත පටිගත කළා. මොකද එහි පෙර පටිගත කිරීම්වල විශාල කාර්මික දෝෂයක් තිබුණා නිසා. මේ සංයුක්ත තැටි දෙකම ඉදිරියේදී රසිකයින්ට රස විඳින්න පුළුවන්. ''සරස වසන්තය'' සංගීත ප්‍රසංගයටත් මේ දෙකම රැගෙන එන්න පුළුවන් වෙයි කියල හිතනවා.

**දීපිකා** - පසුගිය කාලයම ගතවුණේ මගේ අධ්‍යාපන කටයුතුවලට. මම මගේ පශ්චාත් උපාධිය අවසන් කළා. මේ දිනවල මම මගේ අලුත් සංයුක්ත තැටියට සූදානම් වෙනවා. දැනට ගීත කිහිපයක් පටිගත කරලා ඉවරයි. මේ සංයුක්ත තැටියෙ තනු නිර්මාණ සියල්ලම කරන්නෙ රෝහණ වීරසිංහයන්. ලබන වසරෙ

*සංවාද සටහන*

**රවි සිරිවර්ධන**

මුල විතර වෙනකොට එහි වැඩ අවසන් කරන්න පුළුවන් වෙයි කියල හිතනවා.

**දයාන්** - පසුගිය කාලෙ මම හුඟාක් කාර්ය බහුල උනේ ඡායාරූපකරණයත් එක්ක. ඒ අතරෙ ගීත කිහිපයක් පටිගත කරන්නත් ඉඩ හොයා ගත්තා. ඒ සමගම මාතෘ සෙනෙහස යන තේමාව මුල්කර ගෙන වෙනම සංයුක්ත තැටියක් කරන්නත් හිතාගෙන ඉන්නව. හැබැයි මේ කාලෙ හොඳ නිර්මාණ කිරීමත් ටිකක් අභියෝගයක්. මොකද ඊට මාධ්‍ය මගින් කිසිම සහයෝගයක් නැහැ.

**ලංකාවේ සංගීත ක්ෂේත්‍රය හුඟක් පිරිහිලා කියල බුද්ධිමත් රසිකයින්ගෙ චෝදනාවක් තියනවා. මේ ගැන මොකද හිතන්නෙ. ?**

**සෝමතිලක** - ඒ චෝදනාවෙ සැළකිය යුතු ඇත්තක් තියනවා. මොකද දැන් ඇහෙන නව නිර්මාණ දිහා බැලුවම ලංකාවෙ සංගීතය යායුතු අතක් නොදැන අතරමං වෙලා කියලයි හිතෙන්නෙ. මට හිතෙන්නෙ නිවැරදි දැක්මක් හා ශිල්පීය නිපුණත්වයක් නැති උනාම උසස් නිර්මාණ බිහිවෙන්න විදිහක් නෑ. අලුත් පරපුර තුළ අති දක්ෂයින් ඉන්නවා. ඒත් ඔවුනට නිවැරදි සමාජ දැක්මක්, විෂය දැනුමක් නෑ. උසස් රසවින්දනයක් නැතිව උසස් නිර්මාණ කරන්න බෑ. අපි ඉස්සෙල්ලා හොඳ රසිකයෙක් විය යුතුයි. අලුත් පරම්පරාව සතු දක්ෂතාවන් හොඳ නිර්මාණයක් දෙසට මෙහෙයවන්න නම් ඒ දක්ෂතාව දැනුමෙන් හා පුහුණුවෙන් පොහොසත් කර ගන්න ඕන. අපිට ඔවුන් කෙරෙන් පේන්නෙ ඒ අඩුව. අනිත් අතින් අපි කරළියට ආපු යුගයෙ හොඳ නිර්මාණවලට මාධ්‍ය මගින් හොඳ සහයෝගයක් තිබුණා. අද ඒක දකින්න නෑ. අද මාධ්‍ය ප්‍රචාරය ලැබෙන්නෙ විකෘති කරන ලද සංගීත ධාරාවකට. මේසියල්ල ක්ෂේත්‍රයේ පසුබෑමට හේතුවෙලා තියනවා.

**දීපිකා** - කාලයෙන් කාලයට විවිධ සංගීත රැළි එනවා. ඒක නවත්වන්න කාටවත් බෑ. ඒත් මම හිතන්නෙ අන්තිමේදී ඉතිරි වෙන්නෙ හොඳ දේ විතරයි. අපිට හොඳ සංගීත ප්‍රතිපත්තියක් අධ්‍යාපන ක්‍රමය තුළවත් නැති කොට අලුත් පරපුරට නිවැරදි සංගිත ඥාණයක් ලබාගන්න තියන අවස්ථාව අඩුයි. අනිත් අතින් අද හුඟාක් මාධ්‍ය ආයතන මෙහෙයවන්නෙ පරිණත දැනුමකින් හා රසවින්දනයකින් යුක්ත පිරිසක් නෙවෙයි. මේ අයට තියෙන්නෙ ව්‍යාපාර ඥාණය මිස සමාජයට දැනුවත් ඇසක් රසයක් දිය හැකි කුසලතාවයක් නෙවෙයි. මේ අයට මුදල් වලින් මිස ශ්‍රාවක රසවින්දනයෙන් වැඩක් නෑ. අද මාධ්‍ය ආයතන හුදු වෙළෙඳ ප්‍රචාරණ ආයතන බවට පත්වෙලා. මේ පසුබිම මැද උනත් තවමත් හොඳ රසිකයින් පිරිසක් අපට ඉතිරි වෙලා ඉන්නවා ලංකාවෙ වගේම ඕස්ට්‍රේලියාව තුළත්. ඒ ගැන අපට සතුටුයි. ඒ හොඳ දේ අගයන පිරිස නිසා තමයි තවමත් හොඳ නිර්මාණ කරන්න අපිට ශක්තිය ලැබිල තියෙන්නෙ.

**දයාන්** - මේ යන රැල්ලට ඉඩදීල බලාගෙන හිටියොත් හොඳ රසිකයින් අපේක්ෂා භංගත්වයට පත්වෙන්න පුළුවන්. අපේ වගකීම තමයි හැකි විදිහට හොඳ නිර්මාණවලට දායක වෙන එක. මේ පිරිහීම අවම කරන්න නම් වැඩි වැඩියෙන් හොඳ නිර්මාණ කරන්න ඕන. අපිටත් වගකීමක් තියනව මේ පරම්පරා දෙකම යා කරන්න පුළුවන් නිර්මාණ කරන්න. කසුන් කල්හාර වගේ නව පරපුරේ ශිල්පියෙක් අපිට හොඳ බලාපොරොත්තුවක්. ඔවුන්ට පුළුවන් හැමෝටම දැනෙන නිර්මාණ කරන්න. ඒත් අවාසනාව තමයි එවැනි දක්ෂ තරුණයින්ට වඩා අදක්ෂයින් තමයි කරළියට ඇවිත් තියෙන්නෙ. මේක මාධ්‍ය ඇති කරන විකෘති තත්ත්වයක්. අද අපි අහන්නෙ ඇසිය යුතු ගීත නෙවෙයි, අපිට බලෙන් අස්සවන ගීත. දෙමව්පියන්ටත් වගකීමක් තියනවා තමන්ගෙ දරුවන්ට හොඳ මඟපෙන්වීමක් කරන්න. එවිට ඔවුන් නිවැරදි දේ තෝරා ගනිවි. කොහොම උනත් හොඳ නිර්මාණ වෙත ඇස් දල්වාගෙන ඉන්න පිරිසක් තාමත් අප අතර ඉන්න බව අපිට අමතක කරන්න බෑ. ඒ පිරිස හැම රටකම ඉන්නවා. ඕස්ට්‍රේලියාව ඒ අතින් ඉතා ඉහළ ශ්‍රී ලාංකික රසිකයින් පිරිසක් ඉන්න තැනක්. මගේ පළමු සංචාරයෙන්ම ඒ බව මට වැටහුණා.

**ඔබ ඔක්තෝබර් මස ඕස්ට්‍රේලියාවට පැමිණෙනවා සුවිශේෂ සංගීත ප්‍රසංගයකට. ඒ ගැන මොකද හිතන්නෙ.**

**සෝමතිලක** - ඇත්තටම මම විදේශ රටක ප්‍රසංගයකට යන පළමු අවස්ථාව මේක. මම ලංකාවෙ උනත් එළිමහන් ප්‍රසංගවලට සහභාගි වෙන්නෙ නෑ ප්‍රතිපත්තියක් මත. මොකද මම කැමැති නෑ ප්‍රවීණ වාද්‍ය වෘන්දයක්, හොඳ ශබ්ද පරිපාලනයක් නැතිව ගීත ගායනා කරන්න. මේ දෙක මට මුදලට වඩා වැදගත්. ගීතයේ මුල් රසය නොනසා ගයන්න හැකි පසුබිමක විතරයි සහභාගි වෙන්නෙ. ඊට නුසුදුසු ප්‍රසංග මම බාර ගන්නෙ නෑ. මට ලෝකයෙ හුඟක් රටවල ශ්‍රී ලාංකික සංවිධායකවරු ප්‍රසංග සඳහා ඇරයුම් කරල තියෙනවා. ඕස්ට්‍රේලියාවෙනුත් මීට පෙර කිහිපවරක්ම ඇරයුම් ලැබුණා. ඒත් අර කොන්දේසි පිළිබඳව මම තෘප්තිමත් නැති නිසා මම සහභාගි උනේ නෑ. මොකද රසිකයින්ට අපි දිය යුත්තේ රස නොසුන් ගීතයක්.

''සරස වසන්තය'' ප්‍රසංගයේදී මට ශ්‍රී ලංකාවෙන් ප්‍රවීණතම වාද්‍ය වෘන්දයක් ලැබෙනව රෝහණ වීරසිංහයන් ප්‍රමුඛ. ඒ වගේම රෝහණ සංගීතය අධ්‍යක්ෂණය කරන ප්‍රසංගයක ලොකු වගකීමක් මම දකිනවා. මේ ප්‍රසංගයේදී මට ඒ විශ්වාසය තියනවා. ඒ නිසා මම මෙයට සහභාගී වෙන්න තීරණය කළා. මට හිතෙනවා ඕස්ට්‍රේලියාවේ හොඳ රසිකයින් පිරිසක් ඉන්නවා කියලා. මට ඒක සතුටට කරුණක්.

**දීපිකා** - මේ මගේ 3 වන ඕස්ට්‍රේලියානු සංචාරය. ඒත් මට මෙය විශේෂයි. මොකද මම පළමු වතාවට තමයි සෝමතිලක ජයමහ ගායන ශිල්පියා සමඟ සහභාගී වෙන්න ලැබෙන්නෙ. ඔහු ප්‍රවීණතම ශිල්පියෙක් වගේම ඔහුට හොඳ රසික පිරිසක් ඉන්නවා. අනික ඔහු එකඟවූණ පළමු විදේශ සංචාරයටම මටත් සහභාගී වෙන්න ලැබීම අමතක නොවන අත්දැකීමක්. අනික් දේ තමයි ඕස්ට්‍රේලියාවෙ ඉන්න රසික පිරිස ගැන අපිට සැකයක් නෑ. ඔවුන් හොඳ රසිකයින්. ඒ වගේම හොඳ රසික පිරිසකට ගීත ගැයීම මට ලොකු ආශ්වාදයක්.

**දයාන්** - මේ මගේ දෙවන ඕස්ට්‍රේලියානු සංචාරය. මම පළමු වරට සහභාගි උනේ ගිය වසරේ පැවැති ''රෝහණ රන්සර'' ප්‍රසංගයට. ඒක මට අමතක නොවන එකක් වුණා. මට සතුටු විය හැකි රසික ප්‍රතිචාරයක් ලැබුණා. ඒ විශ්වාසය මට හොඳ ශක්තියක්. 'සරස වසන්තය'' ප්‍රසංගයට සහභාගි වෙන්න. විශේෂයෙන්ම සෝමතිලක ජයමහ වගේ ශිල්පියකු සමඟ සහභාගි වෙන්න ලැබීමත් සුවිශේෂයි. ඒ වගේම දීපිකාත් හොඳ රසික පදනමක් තියන ශිල්පිනියක්. මම හිතනවා ''සරස වසන්තය'' ප්‍රසංගය අපේ රසිකයින්ට ගයන්න සුන්දරම අවස්ථාවක් වෙයි කියලා.

Lead Accounting & Taxation Services
Public Accountant and Registered Tax Agent

Refunds within 14 days
Tax Returns 2007

ශ්‍රී ලාංකික ඔබට සුහද සේවය

Services
- Individual/ Business/ Investment Property Tax Returns
- Accounting/ Bookkeeping
- Preparation of Business Activity Statements(BAS)
- Audit of Non-for-Profit Organization and Self-Managed Superannuation Funds
- Personal Service and Advice

L. A. Dayananda Wimalasiri PNA
B.Com, M.Com, M.Bus, Ad.Dip.Acct.

Office
1/1324 Centre Rd, Clayton 3169
TP 03 9544 4995
Fax 03 9544 4997

After Hours
7 Whitton Court, Rowville 3178
P/F 03 9755 7400
M 0402 846 676

leadtax@iprimus.com.au

NIA NATIONAL INSTITUTE OF ACCOUNTANTS
PNA

Kusumsiri - Lead Design House 0430 112 088